ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ
ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன
Sri Lanka Podujana Peramuna

2018.12.26

# මම කාවවත් හමු වුණේ නෑ
# පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂකයා තෝරන්නේ මහින්ද

- බැසිල් රාජපක්ෂ -

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජනාධිපතිවරණ පොදු අපේක්ෂකයා ලෙස මෛත්‍රීපාල සිරිසේන මහතා නම් කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ඔහුගේ නියෝජිතයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රී මලිත් ජයතිලක මහතා සහ ජනාධිපති උපදේශක නීතිඥ ශිරාල් ලක්තිලක යන මහතා තමා හමු වූ බවට පල වන වාර්තා සම්පූර්ණයෙන්ම අසත්‍ය බව බැසිල් රාජපක්ෂ මහතා අවධාරණය කරයි.

මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු පැහැදිලි කළ බැසිල් රාජපක්ෂ මහතා.......

ශිරාල් ලක්තිලක හෝ මලිත් ජයතිලක මෑතකදී මට නිකමටවත් මුණගැහිලා නෑ.... අඩුම ගානේ මගුල් ගෙදරකදී, දානෙ ගෙදරකදිවත් මෑතකදි ඔවුන් මට හමුවෙලා නෑ. අනික මෛත්‍රීපාල සිරිසේන මහතාට මා එක්ක යමක් සාකච්ඡා කරන්න උවමනා නම් අතරමැදියො එවන්න අවශ්‍ය නැහැ. අවශ්‍ය කරුණක් තියෙනවා නම් ජනාධිපතිතුමාට පුළුවන් සෘජුවම මා එක්ක කතා කරන්න. මම හිතන්නෙ නැහැ අතරමැදියන් හරහා මා සමග කතා කිරීමේ අවශ්‍යතාවක් මෛත්‍රීපාල සිරිසේන මහතාට තියෙනවා කියලා.

මෙතන දී මම විශේෂයෙන් කියන්න අවශ්‍යයි, පොහොට්ටුවේ ජනාධිපති අපේක්ෂකත්වය තීරණය කරන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයා මිසක් වෙන කවුරුවත්ම නෙමෙයි. අපේ ජනතාවගේ එකඟතාවය ඇතුව අපි පක්ෂයක් විදිහට මීට මාස හය හතකට පෙර එතුමාට ඒ පිළිබඳ පූර්ණ වගකීම භාර දුන්නා. ඒ නිසා නිසි කලට, නිසි ලෙසට ඒ වැඩේ සිද්ධ වෙයි.

**සංජීව එදිරිමාන්න**
**ප්‍රකාශක**
**ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ**